# වැවිලි අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
# තේ පර්යේෂණ මණ්ඩලය

# පුරප්පාඩු

තලවකැලේ හි පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයෙහි පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

**රැකියා විස්තරය :**

අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් මත තේ පර්යේෂණ ආයතනයේ CF, CESS සහ වෙනත් දායක අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති වල සියලුම මූල්‍ය ක්‍රියා කටයුතු හා ක්‍රියාකාරීත්වයන් පිළිබඳ අධීක්ෂණ හා කළමනාකරණ කටයුතු පිළිබඳව වගකීම දැරිය යුතුය.

**බාහිර :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් වසර පහළොවක (15) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද (සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද)

**සටහන :** පරිගණක ගත ගිණුම්කරණ වාතාවරණයක පළපුරුදු බව හා විවෘත බව විශිෂ්ට වාසියක් වනු ඇත.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම

සහ

මධ්‍යම මට්ටමේ කළමනාකරුවෙකු ලෙස (M.M) 1 වන ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකු හෝ අභ්‍යන්තර විගණක ලෙස අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** : HM 1-3 (2016) රු. 86,865 - 15 x 2,270 රු. 120,915/- (මාසිකව)

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් ප්‍රතිලාභ :**

(i) තලවකැලේහි තේ පර්යේෂණ ආයතනයේදී කුලී රහිත හා ගෘහ භාණ්ඩ සහිත නිල නිවාසයක් සපයනු ලැබේ.

(ii) ආයතනයේ පවත්නා වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ පවතින නීති රීති රෙගුලාසිවලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවනු ඇත.

(iii) ආයතනයේ මාර්ගෝපදේශ වලට අනුව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා තොම්ලේ ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

(iv) **අර්ථසාධක අරමුදල :** තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් තේ. ප. ආ. සේවක අර්ථ සාධක අරමුදලට සිය වැටුපෙන් 10% ක් වශයෙන් දායක විය යුතු අතර, ආයතනය විසින් එම අරමුදලට වැටුපෙන් 15% ක් වශයෙන් සිය දායකත්වය ලබාදෙනු ඇත. තවද ආයතනය විසින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) වැටුපෙන් 3% ලෙස දායක වනු ඇත.

(v) එක් ගෘහ සේවක කම්කරු ඒකකයක්ද සපයනු ලබනු ඇත.

(vi) තේ පර්යේෂණ ආයතනයේ (TRI) හි, සේවකයින්ට අදාළවන වෙනත් ආන්තික ප්‍රතිලාභ හිමිවනු ඇත.

මෙම තනතුර ස්ථිර එකකි. අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශය (CV) ඇතුළත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක් සහ අදාළ අධ්‍යාපනික සහ වෙනත් වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතිකපත්වල පිටපත් සහ සේවා සහතිකවල පිටපත් සහ අදාළ ක්ෂේත්‍රයෙහි අයදුම්කරුගේ කුසලතා හා දැනුම තක්සේරුකළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් හා ලිපිනද සමගින් 2021 මාර්තු මස 08 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත අත්සන් කරන අය වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වන්නේය.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට පටහැනි හා අනුකූල නොවන අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

කරුණාකර වැඩිදුර තොරතුරු විස්තර සඳහා තේ පර්යේෂණායතනයේ (TRI) වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

**අධ්‍යක්ෂක,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI),**
**ශාන්ත කූම්බස්, තලවකැලේ.**